# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1990/17 – 2016 ඔක්තෝබර් 26 වැනි බදාදා – 2016.10.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම්පහ කෝරලය සුළු කොට්ඨාසයේ, දිප්පිටිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/ඒකේආර්/2015/509 හා 2015.11.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0379 ක් පමණ වන තලහේන නැමැති ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර ඒ – තලහේන – ප්‍රමාණය: හෙක්. 0.0379 ක් පමණ

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභාව); නැගෙනහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභාව) සහ ඩී. ජී. පියසේන හිමිකම් කියන තලහේන; දකුණට: ඩී. ජී. පියසේන හිමිකම් කියන තලහේන; බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභාව).

ජෝන් ඒ. ඊ. අමරතුංග,<br>
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4 - 3/9/2015/ඩබ්ලිව්එස්/111.<br>
2016 ජූලි මස 13 වැනි දින,<br>
ඉඩම් අමාත්‍යාංශය,<br>
''මිහිකත මැදුර'',<br>
රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.

11 – 534


1A – G24434 – 12 (2016/10)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*